#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1979/42 – 2016 අගෝස්තු 12 වැනි සිකුරාදා – 2016.08.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/B/2014/99.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2016.01.25 වැනි දින අංක 1951/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.01.19 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

චමිල දිනේෂ් බාලසූරිය මයා ඇතුළු සේවකයින් 26 දෙනෙකු, අංක 71/එෆ්/4, බණ්ඩිපිටිය පාර, පිලියන්දල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් හොටෙල් කෝපරේෂන් පී. එල්. සී., අංක 327, යූනියන් පෙදෙස, කොළඹ 02.

අතර පවත්නා 2015.12.28 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් උපාලි සමරවීර මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.01.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

08 – 791/1

1A – G 24017 – 27 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/B/2014/99.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

චමිල දිනේෂ් බාලසූරිය මයා ඇතුළු සේවකයින් 26 දෙනෙකු, අංක 71/එෆ්/4, බණ්ඩිපිටිය පාර, පිලියන්දල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් හොටෙල් කෝපරේෂන් පී. එල්. සී., අංක 327, යූනියන් පෙදෙස, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/B/2014/99.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

චමිල දිනේෂ් බාලසූරිය මයා ඇතුළු සේවකයින් 26 දෙනෙකු, අංක 71/එෆ්/4, බණ්ඩිපිටිය පාර, පිලියන්දල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් හොටෙල් කෝපරේෂන් පී. එල්. සී., අංක 327, යූනියන් පෙදෙස, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ –

ලංකා හෝටල් සංස්ථාව යටතේ සේවයට බඳවා ගනු ලැබූ පහත නම් සඳහන් සේවකයින් 26 දෙනාට 2007 අංක 25 දරන ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනතේ 4 (අ) වගන්තිය උල්ලංඝනය කරමින් ඉහත ආයතනය විසින් කටයුතු කර තිබේද යන්න හා එසේම ජීවන වියදම් දීමනා ගෙවීම, වාර්ෂික වැටුප් වැඩි කිරීම, සුභසාධක පහසුකම් ලබාදීම, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම, සේවා ගාස්තු ගෙවීම වෙනුවෙන් ද එසේම අතිකාල ගෙවීම හා අයවැය සහන දීමනා ගෙවීම් කිරීමේදී ද යම් අගතියක් සිදු කර ඇත්ද යන්න හා එසේ අගතියක් සිදුකර ඇත්නම් ඔවුනට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න වේ.

1. කේ. ඒ. ඒ. එස්. ධම්මික ප්‍රේමරත්න මයා
2. ඩී. ඩබ්. එස්. කුමාර මයා
3. ඩී. ටී. එන්. දමයන්ති මිය
4. ආර්. නයන චන්දන බණ්ඩාර මයා
5. බී. පී. ජයරත්න පතිරණ මයා
6. අමිත් පුෂ්ප කුමාර මයා
7. ඩී. එම්. ඒකනායක මයා
8. ඩබ්. නිමල් ජයරත්න මයා
9. එම්. ඒ. ඩී. පී. ආරියදස මයා
10. ඒ. පී. පරණවිතාන මයා
11. ජේ. ඒ. වයි. සම්පත් සුරංග මයා
12. එන්. ආර්. එස්. ප්‍රදීප් ජයවීර මයා
13. ඩබ්. සමන්ත ශ්‍රී ලාල් සෙනෙවිරත්න මයා
14. එම්. එන්. එම්. නද්ස්මිල් මයා
15. ජේ. සුගතපාල මයා
16. එස්. කේ. මුණසිංහ මයා
17. ජේ. ඒ. ඉන්ද්‍රසිරි අබේගුණවර්ධන මයා
18. එම්. ඒ. චන්දිම මයා
19. ජගත් වීරකෝන් මයා
20. චමිල දිනේෂ් බාලසූරිය මයා
21. බී. ඉන්ද්‍රසිරි ප්‍රනාන්දු මයා
22. නිමල් වෙදගේ මයා
23. ආර්. එම්. කේ. සම්පත් බණ්ඩාර මයා
24. කේ. ඒ. දිනේෂ් සාගර ප්‍රනාන්දු මයා
25. අමල් සුරේන්ද්‍ර ගමගේ මයා
26. ඩබ්. ඒ. ඩී. සනත් මයා

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 – 791/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.